




# අම්මා




තුසිත් රවිඳු අබේනායක

කෙල්ලන් දෙදෙනෙකුට පසුව පුතෙකු පතා ගැබ්බර වුණා අපේ අම්මා පුතෙකුම ලැබෙන්නැයි දානයක් දුන්නා ය. දානය අතරමග දී කොහෙන්දෝ එතැනට කඩා වැදුනු කාක් පිස්සී යැයි ගමේ පාරක් ගානේ පිස්සු නටා ඇවිදින පිස්සු ගැහැනිය දානේ ගෙදර පිස්සු නැටුව අයුරු වැඩිහිටියන් තාමත් රස කරමින් කියනු මට මතක ය. මාත් මගේ අම්මා ගැනත් මගේ පළමු මතකය කාක් පිස්සී ය. පුතෙක් ලැබුණොත් පිස්සු පුතෙකු වේ යැයි අම්මාට මාමලා විහිලු කලේ ලු. මගේ ජීවිතයේ දී හැම-කෙනෙක් මත් කරනා පිස්සු වැඩක් මාත් කළ විට තාමත් ඒ කාක් පිස්සිගේ නම මගේ වැඩත් සමග ඈඳෙන්නේ ඒ නිසා ය. අම්මා ගැබ්බරව සිටි ඒ සන්දියේ මගේ තාත්තා රස්සාව කළේ අම්පාරේ ය. මාතරින් හැරී සැතපුම් දොළහක් පමණ ගෙවා ගිය විට හමුවන කඹුරුපිටිය අපේ තාත්තාගේ ගමයි. අම්මා ගුරුවරියක ලෙස මාපලාන පාසලේ රැකියාව කළා ය. ප්‍රසූතියට නියමිත දිනවල මොකක් හෝ කාරණාවක් නිසා තාත්තා ට කලට වේලාවට ගමට එන්නට බැරි විය. තාත්තා නැතිව ඉස්පිරිතාලයට යෑම ප්‍රතික්ෂෙප කළ අම්මා තාත්තා එනකම් ගෙදරම රැඳෙන්නට තීරණය කළා ලු. මා ඉපදුණේ මාපලාන අපේ ගෙදර මැද කාමරයේ ය. මා ඉපදෙන වේලාවේ ජනේලය ලඟ තිබුණු කාමරංකා පඳුර අදත් නාඹර ගසක් ව මා ඉපදුණු කාමරයට තවමත් සෙවණ සදයි. ස්මාර්ට්ෆෘට් යයි ඔස්ට්‍රේලියාවේදී දකින තෙක් ම ලංකාවේ නොයෙක් තැන් වල ඇවිද ගියත් කාමරංකා ගසක් අදටත් මා දැක ඇත්තේ මුල් ගමේදී ම පමණි. පිස්සු වැඩකදී කාක් පිස්සී පිටින් යන්නාක් මෙන් මුරණ්ඩුකමකදී ඒවා මගේ අම්මා පිටින් යන්නේ එදා ඉස්පිරිතාලයට යන්නට අම්මා දැක් වූ මුරණ්ඩු කම හින්දා ය. අවුරුදු දෙකක් වෙද්දී පවුලට අලුතින් එකතුවන අමුත්තා වූයේ මල්ලී ය. මල්ලී ඉස්පිරිතාලයේ සිට ගෙදර ගෙනා දා මා මල්ලී වෙත පවුඩර් ටින් එකක් විසිකර දමා ගැසුවා ලු. එකත් එකටම ඒ අක්කලා දෙන්නාගේ ආදරයත් හුරතලයත් දෙකට බෙදී යා දැයි ළමා ළපටි මා තුළ හටගත් ඉරිසියාවක් හින් දා වන්නට ඇත. ඊත් එදා පටන් අපේ අම්මා අක්කලාට වඩා වැඩි ආදරයක් මටත් මල්ලීටත් තිබුණත් වෙනසක් වෙන්නට නොදී අපි හතර දෙනා ම තවත් අවුරුදු තිස් ගණනාවක් බලා හදා ගත්තා ය.

අපේ අම්මා ඉපදුනේ යටියන ග්‍රාමයේ දී යැයි මට මතකය. ඒත් හැදී වැඩුණේ ඊට හැතැම්ම පනහක් ඈතින් වූ අම්බලන්තොට බොලානේ ය. අපේ මුත්තා වෙළඳාමක් කරන්නට බෝලාන ගමට සේන්දු වුණත් මට මතක ඇති කාලයේ දී ගොවිතැන් කළා මිස කඩයක් කලා යයි අහලාවත් නැත. මුත්තා කොළඹ පැත්තේ සුද්දෙකු ළඟ තරුණ කාලයේ ඩ්‍රයිවර් වැඩක් කර ඉංග්‍රීසිය පවා කටගා ගත්තෙකි. අම්මා ඉස්කෝලේ යවන්නට උනන්දු වන්නට ඇත්තේ අපේ මුත්තා ය. ඒ කාලේ පලාතේ හැටියට ගුරු පත්වීමක් ගන්නට තරම් දුරක් අම්මා ඉගෙන ගත්තේ ඇගේ පරම්පරාවේ අයවලුන්ගෙන් ආන්ඩුවේ රස්සාවක් ගන්නා පළවෙනි තැනැත්තා හැටියට ය. අද මෙන් නොව ලේ දන් දුන් විට එදා ආන්ඩුවෙන් ලැබෙන ගතමනාවකින් අම්මා සාරියකුත් කුඩයකුත් අරගෙන ගුරුතුමියක වූ හැටි අම්මා කියනවා අපට මතකය.

අම්මා ඇත්තෙන්ම ගුරු උතුමියකි. තරගෙට වැදී ශ්‍රේණි ලබන්නටවත් පන්දමක් අල්ලා හෝ හිතවත් කම් නිසා හෝ උසස්වීම් ලබන්නට වත් හෝ අඩුම තරමින් ප්‍රශ්ණ පත්තර බලා අමතර ආදායමක් ලබන්නටවත් කිසිදා වෙහෙසක් නොදැරූ අම්මා විශ්‍රාම යනතෙක් පුහුණු ගුරුවරියක ව මනාව රැකියාව කළා ය. උවමනාවකටවත් කවදාවත් නිවාඩුවක් දැම්මාදැයි මට මතක නැත. හැමදාම තමන්ගේ පන්තියේ ළමුන් ගැනම සිහියෙන් ඉගැන්නුවා ය.

වරක් පාසලේ දී අඬමින් සිටි දැරියක ලඟට ගෙන අඬන්නේ ඇයි දැයි ඇසූ විට ඊට හේතුව ඇගේ තාත්තා පෙර දින බීමත්ව ගෙදර ඒම බව දැන ගත්තා ය. තවත් ගුරුවරියක කැටුව ඇගේ ගෙදරට ගිය අම්මා එවන් දක්ෂ දැරියකගේ උගැන්මට කරදරයක් නොවන විධියට ඉන්නැයි ඇගේ තාත්තා ට අවවාද කළා ය. පසු කලෙක ඉහළටම ඉගෙන විශ්වවිාාලයටත් ගිය ඇය ට අපේ අම්මා ඇගේ තාත්තා ට කළ අවවාදය යම් තරමකට හෝ පාදක වන්නට ඇත.

අම්මා අම්මා වූයේ අප හතර දෙනාට පමණක් නොවේ. ඇගේ තාත්තාටත් නෑ සනුහරේ හැමොටමත් පාහේ අම්මා වූවා ය. අප පුංචි වුන් කාලයේ තිස් හතළිස් ගණනක් තරම් මාමලාත් පුංචි අම්මලාත් අපට හිටියේ ඒ හින්දා ය. අම්මාගේ සොයුරු සොයුරියන් ට පමණක් නොව ඇගේ ඥාති සොයුරු සොයුරියන්ගේත් හැම ඕනෑ එපාකමටත් ගුරුහරු කමටත් හිටියේ අපේ අම්මා ය. පවුලෙන්ම වැඩිමලා වීමත් මුලින්ම ලැබූ ගුරුකමේ ගෞරවයත් උවමනා එපා කමකට පිහිට වන්නට තිබූ ආර්ථික හයි හත්තියත් ඒවාට බලපාන්නට ඇත. මාතර අපේ ගෙදර සිට පාසල් ගිය ළමුන්ගේ ගණන අතේ ඇඟිලි වලින් ගණින්නට හැකි නම් මාතර රොහලේ ඉපිද මුල් මාස කීපය අපේ ගෙදර ගෙවූ සිඟත්තන්ගේ ගණන මගේ පවුලේ සියල්ලන්ගේම අතැඟලි වලටත් වඩා වැඩි වන්නට ඇත. අම්මා ඒ මුලු පවුලටම ලොකු අක්කා ය.

මට අම්මා මුලින්ම මතක අපි මාපලානේ විසූ සමමේ ය. පොඩිවුන් වූ මල්ලිත් මමත් මිදුලේ සෙල්ලම් කරමින් සිටිමු. හින්නෝ කෑ තැන් කසා මතුවුණා පුංචි තුවාල කසමින් පඩියේ වාඩි වී විටිනා මට ගේට්ටුව සද්ද වෙනු ඇසෙයි. ලස්සන සාරියකින් සැරසී කුඩයකුත් ඉහලාගෙන ගේට්ටුවෙන් ඇතුල්වෙන අම්මා ලඟට අපි පිම්මේ දුවමු. මල්ලී හා සම වයසේ උන් බාප්පාගේ පුතාත් පෙලට වැටී අම්මා ළඟට දුවඑයි. අම්මා මට මුලින්ම මතක එහෙම ය. ඉන් පසු ජීවිතයේ අම්මා හා මුහු නොවුනු මො-හොතක් මතක් කරන්නටත් බැරිය.

ගමේ පදිංචිය අතහැර අපේ පාසල් යාම සඳහා නගරයට ආවාට පසු පහේ පන්තිය ට යනකම් මමත් අම්මාත් එකම පාසලේ අකුරට ගියෙමු. පුංචිම සන්දියේ අම්මා මා අතින් අල්ලාගෙන පාසලට එක්කරගෙන යන්නට ඇත. ඇගේ අගේ එල්ලී වට පිට බලමින් මගේ පය එක්කෝ ගලක මුලක පැකිලෙයි. නැත්නම් අහක බලාගෙන කාගේ හෝ ඇඟේ හැපෙයි. ඉතින් අම්මාගෙන් බැනුම් ය. අතේ එල්ලීගෙන යන ගමනේත් වෙන ලෝක වල ඉගිල්ලෙනවා යැයි අපේ අම්මා මා ගැන කියන විට තවමත් මතක් කරයි. චුට්ටක් ලොකු වත්ම මල්ලී අම්මා අතේ එල්ලෙන්ට ආ නිසවෙන් මාග් ආසාවෙන් අහල පහල කොලු නඩය සමග පන්සල් වත්ත මැදින් වැටුණ තුත්තිරි ගොඩේ අඩි පාරට පුරුදු වන්නට ඇත්තේ පොත අස්සේ දමාගත් විට ඇටසැකිල්ල විතරක් ඉතුරු වන බෝ කොලත් වටේටම මුල් අඳිනා අක්කාපාන කොලත් ඇහිඳ ගැනීමේ ආසාව පලවෙනි තැනට එන්නට ඇති හින්දා ය. ඇගෙන් බො-හෝ දුර ඈත දරු පවුලක් රකිනා මට තවත් වාරයක් ලැබේ නම් පහේ පන්තියට යනකම් හැමදාමත් උදෑසන ඇගේ අත අත නොහැර ඇගේ අතේ එල්ලීගෙනම පාසලට යනවා නො-අනුමානය.

පුංචි කාලයේ අපට හැමදේම නොඅඩුව තිබුනි. නොඅඩුව තිබු දේ අතරට හැම අප්‍රේල් නිවා-ඩුවටම බෝලානේ අත්තම්මලාගේ ගෙදර ගිහින් ඇවිත් සතියකින් විතර සෑදෙන මැලේරියා උනත් අයත් ය. මැලේරියා උනට බයේ අම්මා අප අත්තම්මා හා මුත්තා සමග ගෙවන ඒ සොඳුරු මිහිරි නිවාඩුවට කවදාවත් තහංචි නොදැම්මා ය. මැලේරියා උන සෑදී ඔත්පල වූ විට දොස්තර බෙහෙත් දුන්නා ය. අන්තිමේ දී අපිත් ඒ ගමේ කොලු රැල මෙන් ම මැලේරියා උනට ඔරොත්තු දෙන කොල්ලන් වූයෙමු. අඩු නැතුව ලැබුන අනෙක් දේ අතර නිදහස ද මුල්තැනක් ගති. ගහක කොලක නගින්නටත් වැටී ඔලු පලා ගන්නටත් මහ වැස්සේත් ක්‍රිකට් ගසන්නටත් ඉන්පසු වහලේ පීල්ලෙන් නාන්නටත් අපට අවසර තිබුනි. පීල්ලෙන් නෑ අප සබන් ගා සෝදා පිහිදමා ගෙට ගත්තාට පසුව තාත්තා හැම වැහිදාටම පාහේ සාදන රොටී කා තේ බොමු. ගෙදර වැඩ එන්නේ ඉන්පසුව ය. ඒවාත් අඩු නැතිව තිබුනි. රචනා ලියන්නටත් ගනන් හදන්නටත් වැරදුන කල පුංචි පහේ ගුටියක රස බලන්නටත් අවස්ථාව එමට තිබුනි.

මේ නිදහස මැකී යන එක් අවස්ථාවක් මට මතක ය. ඒ නුවර පෙරහැර බලන්නට අවුරුදු පතා අගොස්තු නිවාඩුවට නුවර යන ගමනයි. පාන්දරම රුහුණු කුමාරිය ට ගොඩවන අපි මූනට මුන බලාගෙන ඉඳිනා ආසන හතරක හෝ අටක වාඩි වෙමු. බොහෝ විට අටම පිරෙන්නේ අපත් සමග යන අපේ ඥාතීන් නිසා ය. ජනේලය අයිනේ කොන් හතරට හැමදාම වලියකි. පුංචි අපි කාටත් ඕනෑ ජනේලය ලඟ අයින ය. වීදුරුව ඇරගෙන කපාගෙන එන සුළඟට මුහුන අල්ලාගෙන කෝච්චියේ යාම තරම් පුංචි අපට සතුටක් තවත් නැත. මල්ලීත් මමත් දුම්රිය කවුලුවෙන් මුහුන එලියට පො-වනවාත් සමග අපේ නිදහසට කනකොකා අඩඩන්නට පටන් ගනියි. බෑග් එකෙන් මෆ්ලර් දෙකක් ගන්නා අම්මා ඔලුවෙන් පොරවා කන්දෙක වැහෙන්නට ඒවා මගේත් මල්ලීගේත් නිකට යටින් හිරවන සේ ලොකු ගැටයක් ගසයි. පැනල් රෙද්දෙ-න් කල ඒ මෆ්ලර් මට වහකදුරු වගේ ය. මටත් මල්ලීටත් දැනෙන්නේ අපි දෙන්නා උන්හිටි ගමන් සුකුමාල කෙල්ලන් දෙන්නෙකුට ඇන්දුවා වගේ ය. මහම කරදරයකි. කොල්ලන්ට නොගැලපෙන වැඩකි. මගේ මෆ්ලරය උන්හිටි ගමන් සුළඟට අසුවී ගසාගෙන ගියේ ගැසූ ගැටය බුරුල් වූ නිසා නොව මා එය හො-රෙන් බුරුල් කර හුලඟට යන්නට ඉඩදුන් නිසා බව මගේ අම්මා එදාත් දැන හිටින්නට ඇතැයි මගේ පුතු උගේ අම්මාට ගහන්නට හදනා දඟංගැට දකිනා මට සිතේ.

අපේ පවුලේ කලුබැටලුවා වූයේ මා ය. අම්මාගේ සිතැඟි පරිදි ඉහලට ඉගෙන නොගත්තේ මා පමන ය. සෙල්ලමෙන් කොල්ලන් සමග ඇවිදින්නටත් අම්මාගේ අදහස අනුව වල් පල් නවකතා කියවන්නටත් පුරුදු වූ මට විශ්ව විාාලයට යාමට උවමනාවක් කවමදාකවත් නොතිබුනි. අපේ පවුලේ දරුවන්ගෙන් ඈ වැඩියෙන්ම දුක් ගන්නට ඇත්තේ මා ගැන ය. මගේ අම්මාගේ බලාපොරොත්තු සපල නොකල දරුවකු ලෙස අද පියෙකු ලෙස මා සිත නැගෙනා කනස්සල්ල පහ කරන්නට මට බැරි ය. ඒ හැරුනු කොට මම ඔවුන් හැරදමා විදේශ ගත වන්නට ද තීරණය කළෙමි. මල්ලී නොරට ඇදෙන්නටත් මා ගත් ඒ තීරනය ලොකු සරනක් විය. පුතුන් දෙදෙනා ම නොරටකට වී විඳින දුක් කැන දුක් ගන්නා අගේ සිතැඟි ගැන මට ඇත්තේ මහ පොලව තරම් සුවුසල් දුකකි.

මා ඔස්ට්‍රේලියාවේ ෆැක්ටරියක කම්කරු රස්සාවක් කරනවාය යන කරුන ඇගේ හිතට කොයිතරම් දුකක් දෙන්නට ඇතිදැයි මට සිතේ. බැංකුවක උජාරුවට ටයි පටියකුත් පැලඳගෙන හිටි මා ඇගේ දැනුම අනුව සරමක් කැහිපට කවාගෙන දාඩිය නාගෙන කුනු බැනුම් අහගෙන කම්කරු රස්සාවක් කරනවාය යනු අහස පොලව නුහුලනා දුකකි. මගේ පුතු ඉපිදි කල මාස තුනක නිවාඩුවකට ඈ මෙරටට ආවා ය. මගේ ආයතනයේ ප්‍රධානීන්ට කරුනු පැහැදිලි කල මා අප අතිකාල සේ-වයේ යෙදෙන සෙනසුරාදා දිනක ඔවුනට ෆැක්ටරිය පෙන්වන්නට අවසර ඉල්ලා සිටියෙමි. ඉල්ලූ සැනින් සියලු ආරක්ෂක රීති වලට පිටින් අවසරය ලැබුනි. සිසිරයේ එක් සීත උදෑසනක මම මගේ අම්මාත් තාත්තාත් කැටිව මා වැඩපොල වෙත ගියේ මගේ සිඟිත්තා පොරවන දෙක තුනක ඔතාගෙන ය.
මගේ පුදුමයට කිසිදා සෙනසුරාදා වැඩට නොඑනා ආයතනයේ අයිතිකරුත් කලමනාකරුත් මගේ ලොක්කා වන ෆෝමන් වරයාත් අප පිලිගන්නට ෆැක්ටරියේ දොරකඩට පැමිණ සිටියහ. ඉතා ආදරවන්ත හා මිත්‍රශීලී ව මගේ දෙමාපියන් පිලිගත් ඔවුහු ෆැක්ටරිය පුරා සවාරියක මගේ අම්මාත් තාත්තාත් රැගෙන ගියහ. භාෂා ප්‍රශ්නයට පිලිතුර වූයේ මගේ බිරිඳය. ලංකාවේ පුංචි නගරයකින් පැමිනි මගේ අම්මාට එදා ඔවුන් දැක්වූ සංග්‍රහශීලී සුහදතාව මගේ අම්මාගේ හිතේ මහමෙරක් තරම් වූ දුක් ගිනි බරක් බිම තබා සැහැල්ලු හිතේ සන්තෝසයෙන් අියෙත් ගමරට බලා යන්නට මහත් රුකුලක් වූවා යැයි මට සිතේ.